## වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# තේ පර්යේෂණ මණ්ඩලය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# පුරප්පාඩු

තලවකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සභාපතිවරයාගේ පෞද්ගලික සහකාර (කොන්ත්‍රාත් පදනම මත)

**රැකියා විස්තරය:**

සභාපතිවරයාගේ ලේකම් තනතුරට රාජකාරි ඉටු කිරීම සඳහා වගකීම දැරීම.

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්:**

අ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයන් තුනකින් සමත් වීම සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එක් වරක දී සිංහල හෝ දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (04) සහිතව විෂයන් හයකින් (06) සමත් වීම.

**සහ**

ආ) පිළිගත් ආයතනයකින් ලේකම් පුහුණු ජාතික සහතික පත්‍ර වසරක ඩිප්ලෝමා පාඨමාලාව හෝ ලේකම් ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාව (වසරකට නොඅඩු) හදාරා තිබීම.

**සහ**

ඇ) සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ලේකම්වරයෙකු ලෙස අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් තිබීම (එයින් වසරක පළපුරුද්ද ඉහත (ආ) හි සුදුසුකම් ලැබීමෙන් පසුව ලබා තිබිය යුතුය).

**සහ**

ඈ) අවම පරිගණක වදන් සැකසුම ඉංග්‍රීසි හා සිංහල සඳහා පිළිවෙළින් විනාඩියකට වචන 65 සහ 50 ක් විය යුතු අතර , පරිගණක ඉදිරිපත් කිරීම් පිළිබඳ කුසලතා තිබිය යුතුය.

**සහ**

ඉ) ඉංග්‍රීසි සහ සිංහල ලඝුලේඛක වේගය අවම වශයෙන් විනාඩියකට වචන 80 සහ 70 වශයෙන් විය යුතුය.

**සහ**

ඊ) ඉංග්‍රීසි / සිංහල භාෂාවන්හි මනා, දක්ෂ සන්නිවේදන කුසලතාවයන් සහිත විය යුතුය.

**සටහන** : දෙමළ භාෂාව පිළිබඳ වැඩ කිරීමේ දැනුම අමතර සුදුසුකමක් වේ.

**වැටුප් පරිමාණය** : JM 1-2 (2025) රු. 66,781/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ට අනුව 2026.01.01 දිනට හිමි වැටුප)

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරාගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත තරග විභාගයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

මෙම තනතුර වසරක (01) කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වේ. නියමිත අයදුම්පත්‍රය භාවිත කරමින් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ දුරකථන අංක ඇතුළත් කර අයදුම්පත් යොමු කළ යුතුය. සියලුම සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත සමඟ අමුණා තිබිය යුතුය. අයදුම්පත්‍ර ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවිය වන **www.tri.lk** වෙතින් බාගත කරගත හැක.

අයදුම්පත අඩංගු කවරයේ ඉහළ වම් පස කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර **2026 ඔක්තෝබර් 19** දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, සාන්ත කූම්බ්ස්, තලවකැලේ යන ලිපිනයට එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ගේ අයදුම්පත්, තේරී පත් වුවහොත් සේවයට නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතු තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වැඩිදුර තොරතුරු සඳහා තේ පර්යේෂණ ආයතනයේ **www.tri.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**
**සාන්ත කූම්බ්ස්, තලවකැලේ**